# පැරණි ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සන්නිවේදනය, ආගන්තුක සත්කාර සහ බෞද්ධ ආභාසය පිළිබඳ පර්යේෂණාත්මක විශ්ලේෂණයක්: අම්බලම ආශ්‍රයෙන්

එන්.ආර්.එම්.ඩී.එම්. නවරත්න[1]

## හැඳින්වීම

පැරණි ශ්‍රී ලාංකේය බෞද්ධ ශිෂ්ටාචාරය යනු හුදෙක් ආගමික ප්‍රතිපත්තීන් මත පමණක් නොව, එම ප්‍රතිපත්තීන් ප්‍රායෝගික සමාජීය අවශ්‍යතා සමඟ බද්ධ කරමින් ගොඩනැගුණු සුවිශේෂී මානුෂීය සංස්කෘතියකි. වියළි කලාපීය වැව් ගම්මාන සහ අනුරාධපුර, පොළොන්නරුව හෝ මහනුවර වැනි ඓතිහාසික කේන්ද්‍රස්ථාන කරා ඇදී ගිය මාර්ග පද්ධතිය තුළ මඟීන්ට, වන්දනාකරුවන්ට සහ වෙළෙන්දන්ට ගිමන් හැරීම සඳහා ඉදිවූ ප්‍රධානතම සමාජීය ආයතනය 'අම්බලම' ලෙස හැඳින් වේ (දසනායක, 2018). නූතන ලෝකය තුළ සංචාරක කර්මාන්තය සහ ආගන්තුක සත්කාරය යන්න දැඩි ලෙස වාණිජකරණය වූ, මූල්‍යමය ලාභය මත පදනම් වූ ක්‍රියාවලියක් වුව ද, පැරණි ලංකාවේ එය ක්‍රියාත්මක වූයේ පරෝපකාරය, සහෝදරත්වය සහ ආගමික භක්තිය පෙරදැරි කරගත් නොමිලේ සැපයෙන පොදු සමාජ සේවාවක් වශයෙනි.

බුදුදහම ලංකාවට හඳුන්වා දීමෙන් පසු සමාජගත වූ දාන, මෛත්‍රී සහ පරිත්‍යාගශීලී ප්‍රතිපත්තීන් පොදු මහජන ජීවිතය හැඩගැස්වීමේ දී සෘජුවම බලපෑවේය. එහි ප්‍රායෝගික ප්‍රතිඵලයක් ලෙස මඟ දෙපස අම්බලම් සහ පිංතාලි ඉදිවිය. අම්බලම යනු හුදෙක් ගඩොලින්, මැටියෙන් හෝ ලීයෙන් කළ සෙවණක් සපයන ගොඩනැඟිල්ලක් පමණක් නොව, එය එකල සමාජයේ පැවති ප්‍රධානතම ''සමාජ මාධ්‍යය" සහ වාචික සන්නිවේදන කේන්ද්‍රස්ථානය ද විය. නමුත්, නූතන සන්නිවේදන සහ සංචාරක අධ්‍යයනයන්හී දී පැරණි ලංකාවේ පැවති දේශීය ආකෘතීන් බොහෝ විට නොසලකා හැර ඇත. ඒ අනුව මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ "පැරණි ලාංකේය අම්බලම බෞද්ධ සදචාරය සමඟ බද්ධ වෙමින්, එකල සන්නිවේදනය සහ ආගන්තුක සත්කාර හැඩගැස්වීමට දායක වූයේ කෙසේ ද?" යන්න විමසා බැලීමයි. මෙම ගැටලුව විසඳීම තුළින් නූතන වාණිජමය සන්නිවේදන සහ සංචාරක අර්බුදයන්ට දේශීය බෞද්ධ චින්තනයෙන් ලබාගත හැකි ආදර්ශයන් මොනවා ද යන්න ද මෙහිදී විමසා බැලිය හැක.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ, "පැරණි ලාංකේය අම්බලම, බෞද්ධ සදාචාරය සමඟ බද්ධ වෙමින්, එකල සන්නිවේදනය සහ සත්කාර හැඩගැස්වීමට දායක වූ ආකාරය අධ්‍යයනය කිරීම" වේ.

1 ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව.
duleeka.19850@uhss.ruh.ac.lk

මෙම ප්‍රධාන අරමුණට අමතරව තවත් සෙසු අරමුණු 03 ක් මෙහිදී හඳුනාගත හැකිය. එනම්,

- අම්බලම් ඉදිකිරීම් කෙරෙහි බලපෑ බෞද්ධ දර්ශනයේ එන සදාචාරාත්මක සහ සූත්‍රගත උපදෙස් විමසා බැලීම.
- අම්බලම කේන්ද්‍ර කරගත් ලාභ නොලබන සාම්ප්‍රදායික ආගන්තුක සත්කාර ක්‍රමවේද සහ ඒවායේ මානුෂීය වටිනාකම් හඳුනා ගැනීම.
- විවිධ ප්‍රදේශවලින් පැමිණි ජනයා අතර තොරතුරු හා සංස්කෘතික සබඳතා හුවමාරු වූ වාචික සන්නිවේදන කේන්ද්‍රස්ථානයක් ලෙස අම්බලමේ භූමිකාව අධ්‍යයනය කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම්ව සිදුකළ අතර එහිදී ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය යොදා ගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රමය මගින් දත්ත රැස් කරන ලද අතර ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය යටතේ පුස්තකාල සමීක්ෂණය මගින් දත්ත රැස් කරන ලදී. එසේ රැස් කරන ලද දත්ත මාදිලි සැකසීමේ ක්‍රමය යටතේ විශ්ලේෂණය කර අවසන් නිගමනයට එළඹෙන ලදී.

**සොයාගැනීම්**

**අම්බලම යනු**

අම්බලම යනු පැරණි ශ්‍රී ලංකාවේ ගමනාගමනයේ දී මඟීන්ගේ විඩාව නිවා ගැනීම සහ රාත්‍රී නවාතැන් ගැනීම සඳහා ඉදි කරන ලද සාම්ප්‍රදායික ගොඩනැඟිලි විශේෂයකි (දසනායක, 2018). රජවරුන්, වෙළෙන්දන්, වන්දනාකරුවන් සහ සාමාන්‍ය ජනතාව පයින් හෝ කරත්තවලින් දීර්ඝ යාත්‍රා නිරත වන විට, ඔවුන්ට නොමිලයේ රැඳී සිටීමටත්, ආහාර ගැනීමටත්, ආරක්ෂිතව රාත්‍රිය ගත කිරීමටත් මෙම ස්ථාන උපකාරී විය. අම්බලම් බොහෝ විට ඉදි කරනු ලැබුවේ ප්‍රධාන වෙළෙඳ මාර්ග, කුඹුරු යායවල්, විශාල ගස් සෙවණවල් හෝ දියකඩවල් අසල සාමාන්‍ය ජනතාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානවලය. හුදෙක් නවාතැන්පොළක් පමණක් නොවූ අම්බලම, එකල ගම්මුන් එකතු වී තොරතුරු බෙදාහදා ගන්නා, පුවත් කතාබස් කරන සහ විවිධ සාමාජීය සාකච්ඡා පවත්වන වැදගත් කේන්ද්‍රස්ථානයක් ලෙස ද ක්‍රියා කළේය.

මෙම ගොඩනැඟිලි එකල පැවති දේශීය වාස්තු විද්‍යාව සහ කලා කුසලතා මැනවින් පිළිබිඹු කරන කැඩපතක් බඳුය. පිදුරු හෝ උළුක් සෙවිලි කළ අම්බලම්වල සිට ඉතා අලංකාර කැටයම්වලින් යුත් දැවමය අම්බලම් දක්වා විවිධ මට්ටමේ නිර්මාණ ලංකාව පුරා දැකිය හැකිය. මේ සඳහා කදිම උදාහරණයක් වන්නේ මහනුවර යුගයට අයත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති "කරගහගෙදර අම්බලමයි". එය විශාල ගෙලෙමය පර්වතයක් මත දැව කඳන් යොදා නිමවා ඇති අපූරු නිර්මාණයකි. එසේම මහනුවර පිහිටි "පනාවිටිය අම්බලම" එහි ඇති අතිවිශිෂ්ට ලී කැටයම් නිසා ලෝකප්‍රකටය.

මීට අමතරව "අප්පල්ලගොඩ අම්බලම" වැනි ස්ථාන ද ලාංකේය සංස්කෘතික උරුමයේ අනන්‍යතාව කියාපාන ජීවමාන සාක්ෂි වේ.

**බෞද්ධ ආභාසය සහ අම්බලමේ ආධ්‍යාත්මික පදනම**

"බෞද්ධ ආභාසය සහ අම්බලමේ ආධ්‍යාත්මික පදනම" යනු පැරණි ශ්‍රී ලංකාවේ භෞතික නිර්මානකරණය සහ බෞද්ධ දර්ශනය අතර පැවති නොබිඳුණු සබැඳියාව මනාව පසක් කරන, බෞද්ධ චින්තනය සහ ආධ්‍යාත්මික ප්‍රතිපත්තීන් මතම පදනම් වූ උතුම් පුණ්‍යකර්මයකි. සංයුක්තනිකායේ එන 'වනරෝප සූත්‍රය' තුළ මඟීන්ට ගිමන් හැරීමට නවාතැන්පොළවල් තැනීම දිවා රෑ හැමකල්හිම පින් වැඩෙන ක්‍රියාවක් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති අතර, මෙම සූත්‍රගත උපදෙස් ගැඹුරින් විශ්වාස කළ පැරණි ලාංකීය රජවරුන්, ප්‍රභූන් මෙන්ම සාමාන්‍ය ගැමියන් ද සසර සුව පතා මාර්ගය දෙපස අම්බලම් ඉදි කිරීමට පෙළඹුණහ. බුදුදහම තුළ අතිශයින්ම අගය කරනු ලබන, නන්නාඳුනන සංචාරකයෙකු උදෙසා පිරිනමන "ආගන්තුක දානය" සහ "පානීය පැන් දානය" යන සදාචාරාත්මක මූලධර්ම ප්‍රායෝගිකව ව්‍යවහාර කරමින් සෑම අම්බලමකම පාහේ පිපාසිතයන් වෙනුවෙන් මැටි කලයක සිසිල් පැන් තැබූ "පිංතාලියක්" මෙන්ම, ඇතැම් ස්ථානවල සංචාරකයන්ගේ බඩගින්න නිවීම සඳහා නොමිලේ උණුසුම් කැඳ මුට්ටියක් තබන ලද "කැඳ කණුව" ද දැකගත හැකි විය.

අනුරාධපුරය, පොළොන්නරුව හෝ සිරිපාදය වැනි පූජනීය ස්ථාන වැඳපුදා ගැනීමට මාස ගණන් පයින් ගමන් කළ බෞද්ධ වන්දනාකරුවන්ට මෙම අම්බලම් මහඟු රැකවරණයක් වූ අතර, එහි නැවතී සිටි කාලය තුළ ඔවුන් බුදුගුණ ගැයීම, වන්දනා කවි කීම සහ දහම් කරුණු සාකච්ඡා කිරීම නිසා අම්බලම ආධ්‍යාත්මික සන්නිවේදන කේන්ද්‍රස්ථානයක් බවට පත් විය. මෙම අම්බලම්වල භෞතික ව්‍යුහය පවා බෞද්ධ කලාවේ ආභාසය මනාව පිළිබිඹු කළ අතර, උදාහරණයක් ලෙස ඓතිහාසික පනාවිටිය අම්බලමේ සියුම් ලී කැටයම් අතර නෙළුම් මල්, හංස පූට්ටු මෙන්ම වන්දනාවේ යන උපාසක උපාසිකාවන්ගේ රූප නිරූපණය කරමින් මඟීන්ට විවේක ගන්නා අතරතුර පවා ආගමික සිතිවිලි ජනිත කරවීමට දේශීය ශිල්පීන් උත්සාහ කර ඇත.

නූතන නවාතැන්පොළවල් මුදල් සහ පන්ති ක්‍රමය මත පදනම් වන විට, අම්බලම ක්‍රියාත්මක වූයේ "සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" යන බෞද්ධ මෛත්‍රී මූලධර්මය මත කුල භේදයකින් හෝ තරාතිරමකින් තොරව සැමට සමාන අයිතිවාසිකම් සලසමිනි. ඒ අනුව, අම්බලම යනු හුදෙක් ගිමන් නිවන වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් පමණක් නොව, බුදුදහමේ එන දානය, මෛත්‍රිය, පරිත්‍යාගය සහ සත්කාරය යන උතුම් ආධ්‍යාත්මික සාරධර්ම භෞතික ස්වරූපයකින් ප්‍රජාව තුළ ජීවමාන කළ අද්විතීය ඓතිහාසික ස්මාරකයකි.

**සාම්ප්‍රදායික ආගන්තුක සත්කාර ආකෘතිය**

පැරණි ශ්‍රී ලාංකීය සමාජය තුළ මූල්‍යමය ලාභය හෝ වාණිජ පරමාර්ථවලින් තොරව, බෞද්ධ සදාචාරය සහ මෛත්‍රී චින්තනය පදනම් කරගෙන ගොඩනැඟී තිබූ අද්විතීය ක්‍රියාවලියක් ලෙස සාම්ප්‍රදායික ආගන්තුක සත්කාර පෙන්වා දිය හැක. නූතන ලෝකයේ හෝටල් ක්ෂේත්‍රය මුදල් මත පදනම් වූ පන්ති ක්‍රමයකට අනුව හැඩගැසී

ඇති පසුබිමක, පැරණි ලංකාවේ බුදුදහමේ එන "ආගන්තුක දානය" පෙරදැරි කරගත් මෙම දේශීය ආකෘතිය ක්‍රියාත්මක වූයේ පෙරලා කිසිවක් බලාපොරොත්තු නොවන පොදු සමාජ සේවාවක් වශයෙනි. මාර්ගය දෙපස ඉදිවූ අම්බලම් ආශ්‍රිතව පිපාසිතයන් වෙනුවෙන් අවට ගැමියන් ස්වේච්ඡාවෙන් පිරිසිදු දියෙන් පිරවූ "පිංතාලිය" සහ මඟීන්ගේ කුසගින්න නිවීම සඳහා නොමිලේ උණුසුම් කැඳ මුට්ටියක් තබන ලද ''කැඳ කණුව" මෙයට කදිම උදාහරණ වන අතර, දීර්ඝ වන්දනා චාරිකාවල යෙදෙන සංචාරකයන් වෙනුවෙන් අවට ගැමි නිවෙස්වලින් ස්වේච්ඡාවෙන් ආහාර පාන (ඇඹුල) පිළියෙල කර දීමේ උතුම් චාරිත්‍රයක් ද එකල පැවතුණි.

මෙම ක්‍රමයේ පැවති වටිනාම මානුෂීය ලක්ෂණය වූයේ එය සියලු සත්ත්වයන් කෙරෙහි සමානව බලපාන බෞද්ධ මෛත්‍රී මූලධර්මය මත පදනම් වෙමින් කුල භේදයකින් හෝ ප්‍රභූ-ගැමි පන්ති භේදයකින් තොරව සැමට සමාන අයිතිවාසිකම් සැලසීමයි. "සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" (සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා) යන චින්තනය නිසා වෙහෙසට පත් රජෙකුට හෝ රාජපුරුෂයෙකුට වුව ද සාමාන්‍ය වැසියෙකු සමග එකම වහලක් යට වාඩිවී සමාන ලෙස ආගන්තුක සත්කාර විඳීමට අවස්ථාව සැලසුණි. ඒ අනුව, වර්තමානයේ ලෝකයේ බෙහෙවින් කතාබහට ලක්වන, ස්වදේශීය වැසියන්ගේ සහභාගිත්වයෙන් සිදුවන දේශීය සංචාරක කලාව සහ තිරසාර සංවර්ධනය සඳහා ගත හැකි ඉහළම ප්‍රායෝගික ආදර්ශයන් මෙම පාරම්පරික ක්‍රමවේදය තුළ ගැබ්වී ඇති අතර, එය බෞද්ධ ශිෂ්ටාචාරය සතු වූ උසස් සමාජීය ඥානය ලෝකයටම කියාපාන කදිම කැඩපතකි.

**සාම්ප්‍රදායික සන්නිවේදන කේන්ද්‍රස්ථානයක් ලෙස අම්බලමේ භූමිකාව**

පැරණි ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණය හෝ විද්‍යුත් මාධ්‍ය නොපැවති යුගයක, මහජන සන්නිවේදනය සහ සංස්කෘතික හුවමාරුව උදෙසා නිර්මාණය වී තිබූ ප්‍රධානතම දේශීය 'සමාජ මාධ්‍යය' වන්නේ අම්බලමයි. රටේ විවිධ සතර දිශාවෙන් පැමිණි වන්දනාකරුවන්, වෙළෙන්දන්, සංචාරකයන් මෙන්ම රාජපුරුෂයන් ද එකම වහලක් යටට එක් රැස් වූ මෙම අවකාශය තුළ, තමන් පැමිණි ප්‍රදේශවල දේශපාලන තත්ත්වයන්, ආර්ථික රටාවන්, කෘෂිකාර්මික හා කාලගුණික දත්ත මෙන්ම වසංගත රෝග පිළිබඳ තොරතුරු ද ඉතා වේගයෙන් වාචිකව සමාජගත විය. කෝට්ටේ සහ මහනුවර යුගවල ලියැවුණු "සැළලිහිණි සන්දේශය, තිසර සන්දේශය හෝ හංස සන්දේශය" වැනි බෞද්ධ සන්දේශ කාව්‍යයන් පරීක්ෂා කිරීමේදී, පණිවිඩ රැගෙන යන දූතයන්ට විවේක ගැනීම සඳහා මහ සලකුණු ලෙස අම්බලම් භාවිත වූ ආකාරයත්, ඒවා ප්‍රාදේශීය තොරතුරු ලබාගන්නා සන්නිවේදන මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වූ ආකාරයත් පිළිබඳ ඓතිහාසික සාක්ෂි රැසක් හමුවේ. තිසර සන්දේශයේ 17 හා 38වන කවිවල සඳහන් වැල්ලමඩම අම්බලම හා කසරුප්පා අම්බලම ගැන සිදු කර ඇති වර්ණනාව මගින් එකල මඟීන් තොරතුරු හුවමාරු කරගත් සන්නිවේදන මධ්‍යස්ථාන ලෙස අම්බලම ක්‍රියා කළ ආකාරය පැහැදිලි කර ඇත. මෙම ස්ථානයට රට තොට තොරතුරු ලැබුණු බවත්, දෙවිනුවර අසල වූ මෙම අම්බලම එකල ප්‍රභූන් සහ තරුණයන් එකතු වී තතු සාකච්ඡා කළ ස්ථානයක් වූ බවත් කාව්‍යමය සාක්ෂි මගින් අනාවරණය වේ.

භෞතික තොරතුරු හුවමාරුවට අමතරව, අම්බලම යනු ජනශ්‍රැතිය, කලාව සහ උපදේශනය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කළ සුවිශේෂී මානුෂීය සන්නිවේදන අවකාශයකි. රාත්‍රී කාලයේ දී අම්බලමේ ලැගුම් ගත් මඟීන් තමන්ගේ ගමන් වෙහෙස නිවා ගැනීම සඳහා සාම්ප්‍රදායික සීපද කවි, පාරු කවි, ප්‍රස්ථා පිරුළු සහ ජනකතා ගායනා කරමින් අත්දැකීම් බෙදාගත් අතර, එමඟින් ආධ්‍යාත්මික සබඳතා මෙන්ම බුදුගුණ ගැයීම වැනි ධර්ම සන්නිවේදනයන් ද සිදු විය. එමෙන්ම, කිසියම් සංචාරකයෙකුට තම කණ්ඩායමේ සගයෙකු මඟහැරුණු විට, අම්බලමේ මැටි බිත්තියක හෝ ලී කුළුණක අඟුරු කැබැල්ලකින් විශේෂිත ලකුණක් හෝ පණිවිඩයක් ඇඳ තබා යාම වැනි අපූරු පාරම්පරික සන්නිවේදන උපක්‍රම ද එකල භාවිත විය. මෙලෙස, පැරණි අම්බලම යනු හුදෙක් ගිමන් නිවන වාස්තු විද්‍යාත්මක ව්‍යුහයක් පමණක් නොව, බෞද්ධ ශිෂ්ටාචාරයේ මානුෂීය සබඳතා සහ ප්‍රජා සන්නිවේදනය මනාව පෝෂණය කළ සජීවී තොරතුරු කේන්ද්‍රස්ථානයකි.

### නිගමනය

පැරණි ශ්‍රී ලංකාවේ අම්බලම යනු හුදෙක් ගිමන් නිවන භෞතික ස්ථානයක් පමණක් නොව, එය බෞද්ධ පරෝපකාරය, දානය සහ මෛත්‍රිය යන ආධ්‍යාත්මික පදනම මත ගොඩනැඟුණු සුවිශේෂී සමාජ ආයතනයක් බවයි. අම්බලම කේන්ද්‍ර කරගත් ආගන්තුක සත්කාර ආකෘතිය වාණිජ පරමාර්ථවලින් තොර වූ, මානුෂීය ගුණාංගයන්ගෙන් පිරිපුන් එකක් විය. එමෙන්ම එය එකල සමාජයේ තොරතුරු සන්නිවේදනය සහ සංස්කෘතික අනන්‍යතාවන් ප්‍රචාරණය කිරීම අතින් අද්විතීය මෙහෙවරක් ඉටු කළේය. නූතන ලෝකයේ කතාබහට ලක්වන 'ප්‍රජා සහභාගිත්ව සංචාරක කලාව' සහ 'තිරසාර සංවර්ධනය' සඳහා මෙම අම්බලම සතු වූ බෞද්ධ ආභාෂිත පාරම්පරික ඥානය කදිම දේශීය ආදර්ශයක් සපයන බව අවසන් වශයෙන් නිගමනය කළ හැක.

**ප්‍රමුඛ පද** - අම්බලම, ආගන්තුක සත්කාරය, බෞද්ධ ආභාසය, සාම්ප්‍රදායික සන්නිවේදනය, සූත්‍ර දේශනා

### ආශ්‍රිත ග්‍රන්ථ

කරුණාරත්න, පී. (2002). *පැරණි ශ්‍රී ලංකාවේ ගමනාගමනය සහ අම්බලම*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳගමගේ, පී. (1995). *දේශීය ගැමි සමාජය සහ සංස්කෘතිය*. සූරිය ප්‍රකාශකයෝ.

කුමාරසිංහ, ඒ. එම්. (2010). *ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ලී කැටයම් කලාව සහ වාස්තුවිද්‍යාව*. සරසවි ප්‍රකාශකයෝ.

දහනායක, ආර් (2018). *අම්බලම සහ සමාජය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසේකර, එන්. (1989). *පැරණි සිංහල ස්මාරක සහ කලා ශිල්ප*. රාජ්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුව.

සෙනෙවිරත්න, ඒ. (1998). *මහනුවර යුගයේ කලා ශිල්ප*. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.